# යාපනයේ හමුවීම

1975 පෙබරවාරි මස 17 සහ 18 දිනයන්හි ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් යාපනයේදී පවත්වන ලද ගොවි සමුළුවේ වැඩ කටයුතු පිළිබඳ සටහනකි


ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

තැ. පෙ. අංක 1522

කොළඹ.

ප්‍රකාශන මාලා අංක 11

1975 මැයි

# යාපනයේ හමුවීම

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට තෙවසරක් පිරීම නිමිත්තෙන් සංවිධානය කරන ලද වැඩ සටහනක එක් අංගයක් වශයෙන් කොළඹ, අනුරාධපුරය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන්- හට 'වැඩි පලදාවක් සඳහා ජලය සහ භූමිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම' යන විෂයය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් සමඟ අදහස් හුවමාරුවකට අවස්ථාව සළසා දෙමින් 1975 පෙබරවාරි මස 17 සහ 18 වෙනි දිනයන්හිදී යාපනයේ අච්චුවේලි ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථානයේ පැවැති ගොවි හමුවේ වැඩ කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනකි.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 7.

1975 මැයි

1248
තැ: අං: 1522
1975-7-30

## ස්තූතිය

සම්මන්ත්‍රණයේ වැඩ කටයුතු සාර්ථක අයුරින් කරගෙන යාම සඳහා සහයෝගය දෙනු වස් කොළඹ, අනුරාධපුරය, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් හටද, ඔවුන් වෙත සුහදතාවය පිරි නැමූ යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් වෙතද, සම්මන්ත්‍රණයේ වැඩ කටයුතු සංවිධානය කිරීමේ කාර්ය භාරයෙහි ලා සහාය වූ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිල්වා මහතා, ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නීති අංශයේ අධ්‍යක්ෂ අයි. කේ. වීරවර්ධන මහතා, යාපනයේ දිසාපති විමල් අමරසේකර මහතා සහ සමුළුව අමතා කථා කළ යාපනය දිස්ත්‍රික්කයේ දිසාපාලන අධිකාරී එස්. අරුලම්පලම් මහතා වෙතද, සමුළුවට සහභාගී වීමට පැමිණි වවුනියා හා මන්නාරම් දිස්ත්‍රික්කයන්හි දිසාපතීන් වෙතද, චිත්‍රපට දර්ශන ඉදිරිපත් කළ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක අංශයටද, අනිකුත් සියළුම රජයේ නිලධාරීන් හටද, සම්මන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා දිවා රෑ නොබලා කටයුතු කරමින් සහභාගීවූවන් හටද, ආහාර පාන සැපයූ පුත්තූර් පලදා වර්ධන කමිටුවේ සාමාජිකයින් වෙතද, ගොවි මහතුන් හට ඉඳුම් හිටුම් සැළසූ අචුවේලි ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථානයේ නිලධාරීන් හටද, සම්මන්ත්‍රණයට සහභාගී වූ සෑම දෙනාම ආධරයෙන් පිළිගෙන සංග්‍රහ කළ නල්ලූර් පලදා වර්ධන කමිටුවේ සාමාජිකයින් හටද, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ නිලධාරී මහතුන් හටද අවංක ස්තූතිය පිරි නැමේ.

## වචනයක්

1975 පෙබරවාරි මස 21 වන දිනට යෙදුන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පෙවන සංවත්සරය නිමිත්තෙන් පිළියෙල කරන ලද වැඩ සටහනක එක් අංගයක් වශයෙන් 'වැඩි පලදාවක් සඳහා ජලය සහ භූමිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම' යන විෂය යටතේ ගොවි අදහස් හුවමාරුවක් සංවිධානය කිරීමට ආයතනය විසින් කටයුතු සළසන ලදී.

කොළඹ, අනුරාධපුරය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් යාපනය දිස්ත්‍රික්කයට කැඳවා යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් සමඟ සුහද අදහස් හුවමාරුවකට අවස්ථාව සළසා දීම ආයතනය විසින් අරමුණු කර ගන්නා ලද්දේ මෙවැනි ක්‍රියා මාර්ගයක් තුළින් කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ලබා දිය යුතු කවර හෝ සහායක් පිරිනැමීමේ අපේක්ෂාවෙනි. අද ඉතා වැදගත් ප්‍රශ්නයක්ව පවතින ජලය සහ භූමිය සාර්ථක අයුරින් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් කටයුතු කරන ආකාරය පිළිබඳව ඔවුනොවුන් අතර පැහැදිලි අවබෝධයක් ලබා දීම මෙම අදහස් හුවමාරුවෙහි පරමාර්ථය විය.

ගොවි මහතුන් හට සිය වැඩ කටයුතු කරගෙන යාමේදී මුහුණ දීමට සිදු වන ප්‍රායෝගික ගැටළු පිළිබඳව විවෘතව කථා කර මෙම අදහස් හුවමාරුව තුළින් උද්ගත වන වැදගත් කරුණු තීරණයන් සඳහා සැළසුම් සම්පාදකයින් වෙත ඉදිරිපත් කිරීමද තවත් පරමාර්ථයක් විය.

මේ ගොවි අදහස් හුවමාරුවට ක්ෂේත්‍ර චාරිකාවක්ද ඇතුළත් වූ අතර අනිකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් යාපනය දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවලට ගොස් ඉතාමත් සූක්ෂම අයුරින් යාපනයේ ගොවි මහතුන් විසින් ගොවිතැන් කටයුතු කරන ආකාරය සියැසින්ම දැක ගත්හ.

ගොවි සමුළුවෙහි වැඩ කටයුතු කරගෙන යාමේදී තම අදහස් ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් දැක්වූ ඉමහත් උද්යෝගය නිසා සමුළුවෙහි වැඩ කටයුතු ඉතාමත් සාර්ථක වූ බව පැහැදිලිව දක්නට ලැබුණි. ඔවුන්ගේ ඉල්ලීම වූයේ මෙවැනි ගොවි අදහස් හුවමාරු සම්මන්ත්‍රණ දිවයිනෙහි අනිකුත් පළාත්වලද පැවැත්වීමට විධි විධාන යොදන ලෙසය.

සී. නාරායනසාමි
අධ්‍යක්ෂ

# ආයතනයේ අරමුණු හා ගොවි හමුව

මහින්ද සිල්වා
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අරමුණු හා පරමාර්ථයන් පළමු කොටම හඳුන්වා දීම අවශ්‍ය වන්නේය. මෙය කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ පවතින නව ආයතනයකි. මෙම මස 21 වන දිනට එහි වැඩ කටයුතු ආරම්භ කර අවුරුදු තුනක කාලයක් සම්පූර්ණ වේ. තෙවන සංවත්සරය අරබයා සංවිධානය කරනු ලැබ ඇති වැඩ සටහනක එක් අංශයකි, යාපනයේදී පවත්වන ගොවි සමුළුව. කොළඹ, අනුරාධපුරය, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් හට යාපනයට පැමිණ යාපනයේ ගොවි මහතුන් සමඟ තම අත්දැකීම් හුවමාරු කරගෙන යාපනය දිස්ත්‍රික්කයේ ගොවිතැන් කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාවක් සළසා දීමට සංවිධානය කරන ලද මෙම සමුළුව ගොවිකටයුතු ඉතිහාසයේ පළමුවරට පවත්වන මේ විධියේ සමුළුවක් වන්නේය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතුවලට වැඩියෙන් වෙනස් වැඩ කටයුතු සමූහයක් සපුරාලන ආයතනයකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දිගු කාලයක සිට පර්යේෂණ හා පුහුණුවීම් කර ඇත්තේ විවිධ බෝග වගා කිරීම, ඒවා ආරක්ෂා කර ගැනීම සහ බෝග වර්ග සමඟ සතුන් ඇති කිරීම ආදී විද්‍යාත්මක කරුණු පිළිබඳවය. ගොවිතැන් කටයුතු සඳහා මෙම පර්යේෂණ ඉතා වැදගත්ය. එහෙත් විද්‍යාත්මක අංශයේ ප්‍රශ්න පිළිබඳව මෙන්ම තවත් ප්‍රශ්නවලට මුහුණ දීමට ගොවි මහතුන්ට සිදු වේ. ඇතැම්විට මෙම ප්‍රශ්න විද්‍යාත්මක ප්‍රශ්න තරමටම වැදගත් තත්වයක් ගන්නේය. ගොවි මහතෙක් පිළිබඳව සළකන කල්හි ඔහු පළමුව සමාජයේ පුරවැසියෙකි. සමාජය තුළ සිදු වන නොයෙකුත් වෙනස්වීම්, නොයෙකුත් හැඩ ගැස්වීම් ගොවි මහතුන් කෙරෙහි බලපායි. ගොවි මහතෙකු හට ආර්ථික ප්‍රශ්න සුළුවෙන් හෝ විසඳා ගැනීමට එම ප්‍රශ්න පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. තමන් සතු ඉඩම් කට්ටියෙන් ලබා ගත හැකි ආදායම වැඩි කර ගැනීම, ලැබෙන ආදායම කුමන කරුණු සඳහා යෙදවිය යුතුද යන සාධක ගොවි මහතුන්ට වැදගත් වන්නේය. කෙටියෙන් කියතහොත් ගොවිතැනකදී විද්‍යාත්මක ඥානය සමඟ සමාජ ඥානය ඒකාබද්ධ විය යුතුය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ආරම්භ කර ඇත්තේ ගොවීන්ට අවශ්‍ය මෙම සමාජ ඥානය පිළිබඳව සොයා බලා ඊට හා අදාළ ගැටළු නිරාකරණය කරගත හැකි මාර්ග යෝජනා කිරීමටය. මෙම කුඩා සමුළුව ගොවිතැන් ඉතිහාසයේ වැදගත් තැනක් ගන්නේ කලාප දෙකක් නියෝජනය කරන දිස්ත්‍රික්ක පහකින්

තෝරා ගත් ගොවි මහතුන්ට පළමුවරට එක සමුළුවකදී තම ගැටළු පිළිබඳව සාකච්ඡා කර ගැනීමට අවස්ථාවක් ලැබෙන හෙයිනි.

මෙහි පැමිණ සිටින ඇතැම් ගොවි මහතුන්ගෙන් ඇතැම් අයෙකුට වී වගාව පිළිබඳව පමණක් අවබෝධයක් තිබීමට පිළිවන. තවත් අයෙකුට අතිරේක බෝග වැවීම පිළිබඳව පමණක් අත්දැකීම් තිබෙන්නට පිළිවන. ඇතැම් ගොවි මහතුන් ගතානුගතිකව ගොවිතැන් කටයුතුවල නිරතව කෘෂිකර්මීය ව්‍යාපාරයක් ලෙස නොතකා සිය යැපීම සඳහා පමණක් කිසියම් බෝගයක් නිෂ්පාදනය කරනවා වන්නට පිළිවන. මෙවැනි කරුණු සියල්ල නියෝජනය වන පරිදි ගොවි මහතුන් තෝරාගෙන ගොවි සමුළුවක් යාපනයේදී පැවැත්වීමට කටයුතු කිරීමෙන් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ඉතා වැදගත් කාර්යයක් ඉටු කර ඇත.

නිලධාරීන් වශයෙන් අපට හැකි වන්නේ අප මෙතෙක් ලබා ඇති අත්දැකීම් හා ඥානය අනුසාරයෙන් ගොවි මහතුන් හට ආධාර කිරීමයි. අත්හදා බැලීමක් වශයෙන් අද දින පවත්වන මෙම සමුළුවෙන් එකිනෙකා ගේ අත්දැකීම් පිළිබඳව ඔවුනොවුනට අවබෝධයක් ලැබී සමුළුවට සහභාගී වන සෑම ගොවි මහතුන් හටම සෙතක් වේවා යයි ප්‍රාර්ථනා කරනු කැමැත්තෙමි. අද දින පවත්වන මෙම සමුළුව තුළින් ලබන අත්දැකීම් ඇසුරෙන් තව තවත් මේ ආකාරයෙන් ගොවි සමුළු පැවැත්වීමට ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට අවස්ථාවක් ලැබෙනු ඇත.

## යාපනයේ ගොවි මහතුන් හැඳින්වීම

විමල් අමරසේකර
යාපනයේ දිසාපති

කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් විවිධ ආකාරයෙන් කටයුතු කරන දිස්ත්‍රික්ක පහක ගොවි මහතුන් එක්තැන් කර ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාවක් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සළසා දී ඇත. මෙවැනි සම්මන්ත්‍රණයක් පැවැත්වීමට යාපනය වැනි ප්‍රදේශයක් තෝරා ගැනීම නොයෙකුත් කරුණු අතින් යහපත් වන්නේය. විශාල වශයෙන් විදේශ විනිමය වැය වන බෝග වර්ග මෙරටෙහි වගා කිරීම සඳහා මෑත කාලයේදී දිවයිනෙහි සෑම පෙදෙසකම කටයුතු ආරම්භ කරන ලදී. ළූනු, මිරිස් හා අර්තාපල් වැනි අවශ්‍ය බෝග වර්ග වගා කිරීමෙහි ලා යාපනයේ ගොවි මහතුන් බොහෝ උනන්දුවක් දක්වා ඇත. මෙම දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් තම ගොවිතැන් කටයුතු කරන ආකාරය පිළිබඳව බලා ගැනීමට අනිකුත් දිස්ත්‍රික්ක වලින් මෙහි පැමිණ සිටින ගොවි මහතුන්ට අවස්ථාවක් ලැබෙනු ඇත.

වියලි කලාපයේ පැවති උග්‍ර නියඟය හේතුකොටගෙන මෙම කන්නයේ වී වගාවට බෙහෙවින් හානි සිදු විනි. වියලි කලාපයේ ගොවි මහතුන් මෙන් නොව යාපනයේ ගොවි මහතුන් බලවත් ආයාසයකින් යුතුව පොලව යට ඇති වතුර ළිං මාර්ගයෙන් ලබාගෙන තම ගොවිතැන් කටයුතු කරගෙන යති. එක් එක් දිස්ත්‍රික්කවල උපයෝගී කර ගනු ලැබෙන වගා කටයුතු ක්‍රම පිළිබඳව අදහස් හුවමාරුවක යෙදී ගොවිතැන් කටයුතු පිළිබඳව ඔවු නොවුන්ගේ දැනුමට තව තවත් අත්දැකීම් එකතු කර ගැනීමට මෙහි පැමිණ සිටින සෑම ගොවි මහතෙකුටම මෙම සම්මන්ත්‍රණයෙන් අවස්ථාවක් ලැබෙන්නේය.

## ගොවි හමුවේ අරමුණ


සී. නාරායනසාමි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ


ආයතනය විසින් සංවිධානය කරනු ලැබ ඇති ගොවි සමුළුවට සහභාගී වීම සඳහා නොයෙකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණ සිටින සියළු ගොවි මහතුන්ද, නිලධාරී මහතුන්ද, ශ්‍රී ලංකාවේ පුවත් පත් නියෝජිතයින්ද, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නියෝජිතයින්ද ගෞරවයෙන් පිළි ගැනීමට සතුටු වෙමි. ගොවිකටයුතු ඉතිහාසයේ පළමුවරට දිස්ත්‍රික්ක පහක ගොවීන් එක් තැන් කරමින් මෙවැනි සමුළුවක් පැවැත්වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන් යාපනයේ දිසාපතිතුමාට ස්තුතිවන්ත වෙමි. මෙම සම්මන්ත්‍රණයෙහි ප්‍රධානතම පරමාර්ථය වනුයේ ගොවි මහතුන් හට සිය අදහස් හුවමාරු කරගෙන ඔවුනොවුන්ගේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා පැවැත්වීමට ඉඩ ලබා දීමයි. දිවයිනෙහි නොයෙකුත් ප්‍රදේශවල දැනට පවතින නියඟය හේතුකොටගෙන ගොවිතැන් කටයුතු කිරීම සඳහා නොයෙකුත් දුෂ්කරතාවයනට මුහුණ දීමට ගොවි මහතුන් හට සිදු වී තිබේ. එවැනි තත්වයක් නිසාම මෙවැනි සමුළුවක් විශේෂයෙන් අවශ්‍ය වන්නේ යයි සළකමි.

අනුරාධපුරය වැනි පළාතක මෙන් යාපනය දිස්ත්‍රික්කයේ ඇල දොලවල් හා ගඟාවන් දක්නට නොමැත. කෙසේ වුවත් පොලව යට ඇති ජලය සිය ගොවිකටයුතු සඳහා මැනවින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් හොඳින් පෙන්වා දී ඇත. එසේම කුඩා ඉඩම් ප්‍රමාණයකින් වැඩිම ආදායමක් ලබා ගැනීමට හැකි වන පරිදි බෝග විවිධාංගකරණයද යාපනය දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන ලක්ෂණයකි. මෙවැනි දේ අරබයා යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් සමඟ කථා කර අනිකුත් දිස්ත්‍රික්කවල ගොවි මහතුන් හට වටිනා අත්දැකීම් ලබා ගැනීමට මෙම සමුළුවෙන් හැකි වන්නේය.

යාපනයේ ගොවි මහතුන් අවුරුද්ද පුරාම තුවර වර්ගයේ හෝ බෝගයක් සිය බිම් කට්ටිවල වගා කිරීමට හැකි වන පරිදි ක්‍රම උපක්‍රම යොදාගෙන ඇති වීම ඔබ යෑමට දැක ගත හැකි වනු ඇත. ගොවි මහතුන් සැමගේම පරමාර්ථය වනුයේ දේශීය නිෂ්පාදනය වැඩි කිරීමයි. යාපනය දිස්ත්‍රික්කයෙන් ගොවිතැන් කටයුතු පිළිබඳව ඉගෙන ගත හැකි පාඩම් ලබාගෙන ඔබ ලද ඒ අත්දැකීම් අනිකුත් දිස්ත්‍රික්ක කරා ගෙන ගොස් ගොවිතැන් කටයුතුවල දියුණුවට එම අත්දැකීම් උපයෝගී කර ගැනීමට ගොවි මහතුන් හට පිළිවන් වන්නේය.

## ගොවි මහතුන් අතර සුහද තාවය හා අදහස් හුවමාරුව ප්‍රචලිත කරවීම උදෙසා ග්‍රාමීය ආයතන වලින් ඉටු වන කාර්ය භාරය

අයි. කේ. වීරවර්ධන
ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නීති අධ්‍යක්ෂ

යාපනයේ පැවැත්වෙන මෙම ගොවි හමුව ඓතිහාසික වශයෙන් ඉතාමත් වැදගත් තැනක් ගන්නේ මෙහි රැස්ව සිටින ගොවි මහතුන් ජාතියේ යහපත තකා ක්‍රියාත්මක කරගෙන යනු ලබන ව්‍යාපාරයක සංකේතයක් ලෙස සැළකීමට පිළිවන් හෙයිනි. පොදු යහපත අරමුණු කරගෙන කිසියම් කාර්යයක නියුතු වීමේදී ජාති වශයෙන් හෝ භාෂා වශයෙන් හෝ පවතින නොයෙකුත් බේද අමතක කර දමා එම කාර්ය සාර්ථක කර ගැනීමට ජනතාව දක්වන උද්යෝගය මෙම සමුළුවෙන් මැනවින් පිළිබිඹු වේ.

ආහාර නිෂ්පාදනය කිරීමේ අති මහත් කාර්ය භාරයක යෙදී සිටින ගොවි මහතුන් තමන්ට අදාළ වන ප්‍රශ්න රාශියක් පිළිබඳව සාකච්ඡා කර එක් ප්‍රදේශයක පවතින ගොවිතැන් ක්‍රම තවත් ප්‍රදේශයක ඉඩම් වලින් වෙනස් වන ආකාරය ආදිය පිළිබඳව අත්දැකීමක් ලබා ගැනීම සඳහා කොළඹ, මන්නාරම, අනුරාධපුරය සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් මෙහිදී යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් හමු වේ.

ගොවිතැන් කටයුතු පිළිබඳ අදාළ වන විවිධ ප්‍රශ්න ගැන මේ ආකාරයෙන් අදහස් හුවමාරුවක් සඳහා ගොවි මහතුන් හට අවස්ථාව සළසා දීමට අතීතයේදී කටයුතු කරනු නොලැබුණි. මෙම ගොවි හමුවේ ඉතාමත් විශිෂ්ඨ ලක්ෂණයක් වන්නේ ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වන ප්‍රශ්න පිළිබඳව නිලධාරීන් කථා කරනවා වෙනුවට ගොවි මහතුන් විසින්ම එම ප්‍රශ්න ඉදිරිපත් කර නිලධාරීන්ගේ සහාය ඇතිව ඒවා විසඳා ගැනීමට ඔවුන් ප්‍රයත්නයක් දැරීමයි.

දිවයින පුරාම ගොවිතැන් කටයුතු වැඩි දියුණු කිරීම සඳහා රජයේ උපදෙස් පරිදි කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් ඉතාමත් සැලකිය යුතු මූලික පරිවර්තන හා වෙනස්කම් කිහිපයක් සිදු කර ඇත. මෙතෙක් කල් පැවතගෙන ආ පරම්පරාගත ඉඩම් භුක්ති ක්‍රමය වෙනස් කර ඉඩම් ප්‍රතිසංස්කරණයක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ඉඩම් ප්‍රතිසංස්කරණයට සරිලන අයුරින් ආයතනික රටාවෙහිද නොයෙකුත් වෙනස්කම් කර ඇත. මේ අනුව ගොවි මහතුන්ට අත දීම සඳහා ගොවි මහතුන්ගෙන්ම සැදුම් ලත් කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටු දිවයින පුරා පිහිටුවා ඇති අතර අද පවතින තත්වයට සරිලන පරිදි පැරණි ගොවි කාරක සභා ප්‍රති සංවිධානය කරගෙන යනු ලැබේ. ගොවි මහතෙකු හට අවශ්‍ය වන යෙදවුම් මෙන්ම ශිල්පීය උපදෙස් ආදියද, ණය මුදල් යනාදියද එකම ආයතනයකින් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමේ අරමුණ පෙරදැරි කරගෙන එක් එක් කෘෂි සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කරගෙන යනු ලැබේ. ජාතියට අවශ්‍ය වන ආහාර බෝග ලබා ගැනීම සඳහා විදේශයන් මත රඳා පැවැත්ම වෙනුවට මෙරට තුළම යටත් පිරිසෙයින් ආහාර බෝගවත් වගා කිරීමේ අභියෝගයට මුහුණ දීම සඳහා මෙම වැඩ පිළිවෙල සකස් කර ඇත්තේය.

මෙතෙක් කල් වැඩි අවධාරනයක් දක්වන ලද්දේ වී ගොවිතැන සඳහා වුවත් වී ගොවිතැනත්, අතුරු බෝග නිෂ්පාදනයත්, සත්ව පාලනයත් ඒකාබද්ධ කර පුළුල් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල වී ගොවිතැනෙහි නියැලී සිටින ගොවි මහතුන් නව ලක්ෂයක් පමණ සිටින අතර ඊ හා සමානම කොටසක් වෙනත් බෝග වැවීමේ කාර්යයෙහි නිරත වී සිටී. පුද්ගලිකව මේ සෑම ගොවි මහතෙක්ම හමු වීමට රජයට හැකියාවක් නොමැත. පුළුල් ආයතන ක්‍රමයක් මගින් ගොවි මහතුන්ගේ සියළුම අවශ්‍යතාවයන් සපුරාලීමට උත්සාහයක් දරන්නේ එහෙයිනි. මෙම ආයතනවලට ගොවි මහතුන් සම්බන්ධ කර ආයතන සඳහා අවශ්‍ය වන්නාවූ නිලධාරී සහාය පවා ලබා දී ජනතාව සමග පොදු අරමුණක් සඳහා එක්ව කටයුතු කිරීමට හැකි වන වැඩ පිළිවෙලක් දැන් ආරම්භ කර ඇත. එහෙයින් අතීතයේ මෙන් නොව පර්යේෂණ හා පුහුණුකිරීමේ කටයුතු වුවද අද දින කළයුතුව ඇත්තේ ගොවි මහතුන් සමග එක්ව ඔවුන්ගේ අදහස් විමසීමෙනි. මෙම පදනම මත අද දින දිස්ත්‍රික්ක පහක ගොවි මහතුන් මෙහිදී හමු වී ඔවුන් සිය අදහස් හුවමාරු කර ගනියි.

# ගොවි මහතුන් අත පවතින අනාගතය

සී. අරුලම්පලම් මහතා
නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ යාපනය දිස්ත්‍රික්කයේ දිසා පාලන අධිකාරී

වර්තමානයේ ගෙන යන වගා සටනේ සටන් පාඨය වී තිබෙන්නේ ජලයෙන් වැඩිම ප්‍රයෝජනයක් ගැනීම හා ඉඩම් වලින් වැඩි පලදාවක් ලබා ගැනීමයි. දිස්ත්‍රික්ක හතරකින් මෙහි පැමිණි යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් හමු වන අනිකුත් ගොවි මහතුන් මෙම සම්මන්ත්‍රණයේදී සාකච්ඡා කිරීමට අදහස් කරන්නේද වැඩි වශයෙන් පොළව යට ඇති ජලය වගා කටයුතුවලට ලබා ගන්නා නොයෙකුත් ආකාරයන් පිළිබඳවයි. ජලය පිළිබඳ මෙම ප්‍රශ්නය විසඳා ගත හැක්කේ ඇත්ත වශයෙන්ම ගොවි මහතුන් හට පමණකි. සාර්ථක අන්දමින් තම ජීවිතය ගෙන යාමටත්, ජාතිය බේරා ගැනීමටත් ඒ වගේම රට රැක ගැනීමටත් දැනට ඇති එකම මාර්ගය වනුයේ ගොවිතැන් කටයුතු අතින් දියුණුවක් ලබා ආහාර ද්‍රව්‍ය පිළිබඳව ස්වයංපෝෂිත බවක් ඇති කර ගැනීමයි. ඒ නිසා ඉතාමත් මහන්සි වී ගොවිතැන් කළයුතු කාලයක් දැන් උදා වී ඇත.

මෙහිදී සැළකිල්ලට ගත යුතු තවත් වැදගත් ප්‍රශ්නයක් නම් රටේ නිෂ්පාදනය කරන බෝග වර්ග සහ ධාන්‍ය වර්ග පාරිභෝගිකයින් හට නොලැබී යාමයි. නිෂ්පාදනය කරනු ලබන මිරිස්, ළූනු යනාදිය හුදෙක් සුළු මුදලක වාසිය තකා කලු කඩ කාරයින්ට විකිණීම හේතුකොටගෙන පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් මැනවින් සපුරාලීමට නොහැකි තත්වයන් වරින් වර උද්ගත වේ. මෙවැනි තත්වයක් යටතේ ඇතැම් විටක සාමාන්‍ය පාලන මිලට සමූපකාරයෙන් ලබා ගත නොහැකිව ඉතාමත් අධික මිලක් ගෙවා මිරිස් යනාදිය කලු කඩ කාරයින්ගෙන් ලබා ගැනීමට හැකි වේ. එහෙයින් ගොවි මහතුන් තමන්ගේ සහෝදර ජනතාවගේ සුභ සිද්ධිය අපේක්ෂා කරමින් කළයුතු එකම කාර්යය නම් තම නිෂ්පාදිත සෑම එකක්ම ප්‍රාගේ සමූපකාරය වැනි රජයේ ආයතනවලට විකිණීමයි. එවැනි ආයතන වලින් නියම මිලක් ලබා ගත නොහැකි නම් ඒ තත්වය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට ගොවි මහතුන් හට පිළිවන. එහෙයින් පොදු ජනතාවගේ කුස ගින්න බේරා ගැනීම සඳහා ගොවි මහතුන් ඉදිරිපත් විය යුතු බව අවධාරනයෙන් සඳහන් කළ යුතුය. අතීතයේ පැවති ධන ධාන්‍යයෙන් සරු ශ්‍රී ලංකාවක් නැවත බිහි කළ හැක්කේ ගොවි මහතුන් හට පමණකි.

## හැඳින්වීම

'වැඩි පලදාවක් සඳහා ජලය සහ භූමිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම' යන මාතෘකාව යටතේ වූ මෙම ගොවි අදහස් හුවමාරුව පිළියෙල කරන ලද්දේ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසිනි. ආයතනයේ තෙවන සංවත්සරය නිමිත්තෙන් 1975 පෙබරවාරි මස 17 සහ 18 වෙනි දිනයන්හිදී යාපනයේ අච්චුවේලි ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථානයේදී ගොවි හමුව පැවැත්විණි. කොළඹ, අනුරාධපුරය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් හට තම ගොවිතැන් කටයුතු පිළිබඳ අත්දැකීම් යාපනයේ ගොවි මහතුන් සමඟ හුවමාරු කරගෙන, යාපනය දිස්ත්‍රික්කයේ වගා කටයුතු දැක බලා ගැනීමට ඔවුන් හට ඉඩ කඩ ලැබිණි.

'පොළව යට ඇති ජලය ප්‍රයෝජනයට යොදා ගන්නා සරල ක්‍රම' යන මාතෘකාව යටතේ පළමුව යාපනයේ ගොවි මහතෙක් විසින් සිය අත්දැකීම් විස්තර කරන ලදී. ඉන් අනතුරුව 'උපරිම ලෙස ජලයෙන් ප්‍රයෝජන ගැනීමට භූමිය සූදානම් කිරීම හා බෝග තෝරා ගැනීම', 'නොකඩවා නිෂ්පාදනය පවත්වා ගැනීමට පසෙහි සාරවත් බව රැක ගැනීම', 'කෘෂිකර්ම නිෂ්පාදිත අලෙවිය' හා 'සමුපකාර සහ ණය' යන විෂයයන් යටතේ ගොවි මහතුන් තම ගොවි ජීවිතය ඇසුරෙන් අදහස් දැක්වූ අතර ඒ ඒ විෂයයනට අදාළ රජයේ නිලධාරීහු ඔවුනට සහාය වූහ.

ගොවි හමුවෙහි දෙවෙනි දින උදය වරුවෙහිදී අනෙකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් යාපනයේ පුත්තූර්, ඉනුවිල්, කොන්ඩාවිල් ආදී ස්ථානයන්හි වගා කටයුතු නැරඹීමට ගියහ. උරුම්පිරායිහි ගොවි මහතෙක් විසින් වගා කර ඇති අක්කර හයක ජමණ මිදි වත්ත ගොවි මහතුන්ගේ විශේෂ සැළකිල්ලට ලක් විණි. කුඩා ඉඩම් ප්‍රමාණයක් තුළ බෝග ජාති කිහිපයක් වවා වැඩි ආදායමක් ලබා ගැනීමට යාපනයේ ගොවි මහතුන් දරන ප්‍රයත්නය අනෙකුත් ගොවි මහතුන් විසින් අගය කරන ලදී. ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබා ගැනීමට යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් ඉතාමත් මහන්සියෙන් යොදා ගන්නා නොයෙක් ක්‍රම උපක්‍රම පිළිබඳව ඕනෑකමින් කරුණු විමසා බැලීමට අනෙක් ගොවි මහතුන් උනන්දුවක් දැක්වූහ.

මෙදින හවස් වරුවෙහි පැවැත්වුනේ සාකච්ඡා වාරයයි. අනෙක් දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් යාපනයේ ගත කළ දින දෙක තුළ ලද දැනුම පිළිබඳවත්, තමන්ගේ පළාත් අනුව මෙම ක්‍රම අවශ්‍ය පරිදි වෙනස් කර ප්‍රයෝජනයට ගත හැකි අන්දම පිළිබඳවත් අදහස් පළ කළහ. මෙම සුහද සාකච්ඡා වාරයේදී ගොවිතැන් කටයුතු ගැන පුළුල් වූත් දීර්ඝ වූත් පළපුරුද්දකින් හෙබි ගොවි මහතුන් සමඟ එක්ව

උද්යෝගිමත් තරුණ ගොවි මහතුන් ගොවිතැන් කටයුතු දියුණුවට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව කරුණු ඉදිරිපත් කළහ.

ගොවි හමුව පැවති දෙදිනේහි ඉදිරිපත් වූ කරුණුවල සම්පිණ්ඩනයක් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලදී.

එදිනම රාත්‍රියෙහිදී ප්‍රචාරක අමාත්‍යාංශයේ චිත්‍රපටි අංශයේ අනුග්‍රහයෙන් පැවති චිත්‍රපටි දර්ශනයකින් හා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ සංනිවේදන අංශයේ මෙහෙයවීමෙන් රූප ගත කරන ලද මෙම ගොවි හමුව පිළිබඳ රූපවාහිනී දර්ශනයකින් පසුව යාපනයේ ගොවි හමුවේ වැඩ කටයුතු **අවසන්** විණි.

## <u>භූ-ගත ජලය ප්‍රයෝජනයට යොදා ගන්නා සරල ක්‍රම</u>

පළමුවෙනි සාකච්ඡාව වූයේ යාපනය දිස්ත්‍රික්කයේ පොළව යට ඇති ජලය වගා කටයුතු සඳහා යොදා ගන්නා නොයෙකුත් ක්‍රම පිළිබඳවයි. යාපනයේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරී ජේ. පොන්නම්බලම් මහතාගේ මෙහෙයවීම යටතේ නීර්වෙලිහි ගොවි මහතෙක් වන වී. මයිල්වාගනම් මහතා යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් ජලය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳව විස්තර කළා. මේ විෂය හඳුන්වා දෙමින් කථා කල දිස්ත්‍රික් ඉඩම් නිලධාරී පොන්නම්බලම් මහතා පැවසුවේ යාපනය අර්ධද්වීපයෙහි සම්පූර්ණයෙන්ම ළිං 86,000 ක් තිබෙන බවයි. මෙයින් ළිං 20,000 ක්ම ප්‍රයෝජනයට ගනු ලැබෙනුයේ ගොවිතැන් කටයුතු සඳහා බව පොන්නම්බලම් මහතා කියා සිටියා. යාපනය දිස්ත්‍රික්කයේ ගලා යන ගංගාවල් හෝ ඇල දොලවල් යනාදිය නැති නිසා දිස්ත්‍රික්කය පුරාම සියළුම ගොවිතැන් කටයුතුවලට ජලය ලබා ගැනීමට සිදුව ඇත්තේ මේ ළිං මගිනුයි. පොන්නම්බලම් මහතාගේ මෙහෙයවීම යටතේ කථා කළ මයිල්වාගනම් මහතා ප්‍රකාශ කළේ හුණු ගල් වලින් සමන්විත යාපනය දිස්ත්‍රික්කයේ පොළව කැන ළිඳක් සාදා ගැනීම එතරම් පහසු කාර්යයක් නොවන බවයි. ඔහු පැවසූ අන්දමට ළිඳක් හාරා ගැනීමට රුපියල් 15,000/- ක් පමණ වැය කරන්නට සිදු වෙනවා. අතීතයේදී අර්ධද්වීපය පුරාම ජලය ලබා ගැනීමට උපයෝගී කර ගත්තේ ආඬි ළිං බව මයිල්වාගනම් මහතා ප්‍රකාශ කළා.

ඔහු පැවසූ අන්දමට ආඬි ළිඳකින් වතුර ලබාගෙන පුළුල් විදිහට ගොවිතැන් කටයුතු කරන්න එතරම් පහසු නැහැ. ඒ නිසා දැන් යාපනයේ ගොවි මහතුන් නොයෙක් ආකාරයේ වෙනත් ක්‍රම ජලය ලබා ගන්න ප්‍රයෝජනයට ගන්නවා. ළිඳට සවි කර ඇති යන්ත්‍රයක් ගවයෙක් යොදා කරකැවීමෙන් ජලය ලබා ගන්නා පාර්ෂියානු ළිඳ ගැන පැහැදිලි විස්තරයක් මයිල්වාගනම් මහතා කළා. සමහරවිට වැඩි මුදලක් යොදවන්නට පුළුවන් අය මෙම ළිං වලට විදුලි පොම්ප සවි කර ඒ මගින් ජලය ලබා ගැනීමට දැන් කටයුතු

සළසා තිබෙන බව මයිල්වාගනම් මහතා කියා සිටියා. ලිඳක් හාරා ගැනීම ඔහු පැවසූ විදිහට යාපනය දිස්ත්‍රික්කයේ දුහාමත් අසීරු කාරියයක්. කලින් නම් පහසුවෙන් ඩයිනමයිට් ලබා ගත හැකි වූ නිසා ලිං කැනීම එතරම්ම අමාරු වුනේ නැහැ. ලිඳක් කැනීමට අවශ්‍ය ඩයිනමයිට් සපයා ගැනීමට ඇති අපහසුකම යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් හට බලපාන වැදගත් ප්‍රශ්නයක් බව මයිල්වාගනම් මහතාගේ අදහස වුනා. දැන් ඩයිනමයිට් ලබා ගැනීම සඳහා කල් තඩ කාරයින්ට අධික මිළක් ගෙවීමට සිදු වන බව ඔහු කියා සිටියා.

යාපනය දිස්ත්‍රික්කයේ පොළවෙහි පිහිටා ඇති ලක්ෂණ පිළිබඳව කරුණු පැහැදිලි කල මයිල්වාගනම් මහතා කියා සිටියේ දිස්ත්‍රික්කය පුරාම මතුපිට ඇති පස් තට්ටුව මත හුණු ගල් තට්ටුවක් ඇති බවයි. මේ ගල් තට්ටුව පසාරු කර ලිඳක් කැනීම අතිශයින් වෙහෙස ගෙන දෙන වැඩපිළිවෙලක් බව ඔහු කියා සිටියා. යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් අඩි ලිං ක්‍රමය අත්හැර දැම්මේ එයට කායික ශ්‍රමය වැඩියෙන් යෙදවීම අවශ්‍ය නිසයි.

මයිල්වාගනම් මහතා තම ගොවිපලේ සෝයා බෝංචි, එළවළු, මයියොක්කා, මිරිස් ආදිය වගා කර ඇති බව කියා සිටියා.

මේ අවස්ථාවේදී යාපනයේ පොලවෙහි සාමාන්‍ය භූ ලක්ෂණ පිළිබඳව හැඳින්වීමක් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති විමල් අමරසේකර මහතා විසින් කරන ලදී. ඔහු මෙසේ පැවසීය.

යාපනය අර්ධද්වීපයේ මතු පිටින් ගලා යන ජලය හෝ වැව් නොමැත. අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය පමණ තෙක් ලැබෙන වැස්ස නිසා එකතු වන ජලය පොලව යටට උරා ගනියි. මුළු භූමියම හුණු ගල් සහිත පසකින් යුක්තය. මේ හුණු ගල්වල ඇති කුහර ජලය උරා ගබඩා කර ගනියි. හුණු ගල් වශයෙන් හඳුන්වනු ලැබුවද මෙම ගල් කළු ගල් තරම්ම තද ගල් වර්ගයකි. මෙම ප්‍රදේශයේ කොන්ක්‍රීට් වැඩ ආදියටද මෙම හුණු ගල් භාවිතා කරනු ලැබේ. සාමාන්‍ය වශයෙන් ගොවිතැන් කටයුතු කරද්දී පවා අඩි තුනක් පමණ යටට හුණු ගල් ඉවත් කර ඉන්පසුව ලැබෙන රතු පස මතුපිට ගොවිතැන් කටයුතු කරනු ලැබේ. ඊට වඩා ගැඹුරු වුවහොත් පසෙහි ලවන රසයක් මතු විය හැකිය.

## උපරිම ලෙස ජලයෙන් ප්‍රයෝජන ගැනීමට භූමිය සූදානම් කිරීම හා බෝග තෝරා ගැනීම

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ආචාර්ය ඩබ්ලිව්. ගුණරත්න මෙම විෂයය යටතේ සාකච්ඡාව මෙහෙයවූවා. යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් විශාල වශයෙන් මුදල් වැය කර ජලය ලබා ගන්නා හෙයින් එම ජලයෙන් ඉතාමත්ම වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහාත් ජලය සූක්ෂම ලෙස උපරිම අයුරින් භාවිතා කිරීම සඳහාත් ගොවිපලේ භූමිය හොඳින් සකස් කළයුතු බව ඔහු සඳහන් කළා. අපගේ තොයවා ඒ ඒ කාලයට ගැලපෙන පරිදි මෙන්ම ඒ ඒ බෝගවලට ගැලපෙන පරිදි ජලය ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවය ආචාර්ය ගුණරත්න විසින් පැහැදිලි කර දීමෙන් අනතුරුව යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතෙක් වූ කේ. පොන්නම්බලම් මහතා සාකච්ඡාවට සහභාගී වී යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් ගොවිපලේ භූමිය සකස් කර ගන්නා ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දුන්නා. බිම සකස් කර ගැනීම සඳහා විශේෂයෙන් මඳ වශයෙන් ලැබෙන වැහි වලින් වැඩිම ප්‍රයෝජනයක් ගැනීමට තමා නිතරම උත්සාහ කරන බව පොන්නම්බලම් මහතා කියා සිටියා. ඔහු පැවසූ අන්දමට වැසි ජලය ලැබී පොළව මතුපිට තෙත් ගතියක් ඇති වූවාට පසු පොන්නම්බලම් මහතා ගොම පොහොර, දිකොල පොහොර ආදිය යොදා ගොවිපලේ බිම සකස් කර ගැනීමට කටයුතු කරනවා. මේ විදිහට පළමුවෙන් බිම සකස් කර ගත්තාට පසුව ළිඳෙන් ලබා ගත් ජලය මැනවින් පසට උරා ගැනීමේ ශක්තියක් ගොවිපලෙහි ඇති වනවා. දේශීය වශයෙන් ලබා ගත හැකි ගොම පොහොර හා කොළ පොහොර වර්ග මෙන්ම රසායනික පොහොරත් තමන් භාවිතා කරන බව ඔහු කියා සිටියා. ගොවිපලේ තක්කාලි ආදිය සිටවා මාසයක් පමණ යන තෙක් ළිඳෙන් වතුර ඇද අතින්ම එම එළවළු පාත්තිවලට වතුර යොදන බව පොන්නම්බලම් මහතා ප්‍රකාශ කළා. මේ විදිහට පැළ පොඩි කාලේදී එළවළු පාත්ති පුරාම අතින් වතුර දැමීමෙන් කානු මගින් වතුර දැමීමෙන් මෙන් නොව වල් පැළෑටි මර්ධනය කර ගැනීමට පහසු වන බව ඔහු කියා සිටියා.

යාපනයේ ගොවිපලවල හුඟක් වෙලාවට ගොවිපල පුරාම ජලය සැපයීම සඳහා තැනින් තැන කානු ඉදි කර තිබෙනවා. එක් තැනකට වත් කරන ජලය මේ කානු දිගේ ගොස් මුළු ගොවිපලටම ලැබෙන හැටියට තමයි එය සකස් කර තිබෙන්නේ. පොන්නම්බලම් මහතා කීවේ මෙම කානු කොන්ක්‍රීට් දමා සිමෙන්තියෙන් සාදා ගැනීමට වැඩි මුදලක් වැය වන හින්දා ප්‍රධාන කානුව පමණක් ඒ විදිහට සිමෙන්තියෙන් සාදා ඇති බවයි.

පොන්නම්බලම් මහතා පැවසුවේ තම ගොවිපලේ එකම බෝග වර්ගයක් පමණක් වවන්නේ නැතිව සැරෙන් සැරේ නොයෙක් බෝග මාරුවෙන් මාරුවට වගා කරන බවයි. ඇතැම්විට ඉක්මණින් වැඩි ආදායමක් ලබා ගැනීමට පිළිවන් වන්නේ යයි අදහස් කරන බෝග

වැවීමට උනන්දුවක් දැක්වීමෙන් ගොවීන් හට වැඩි ආදායමක් ලබා ගත හැකි බව ඔහු කීවා. මේ විදිහට එකම ගොවිපලක මිරිස් වගාව අතරේ එළු වවා ඇති බව ඔහු ප්‍රකාශ කළා. අවුරුද්දකට තුන් වරක් පමණ මිරිස් සිටවා එනයින් වැඩි මුදලක් උපයා ගැනීමට යාපනයේ ගොවි මහතුන් සෑම දෙනෙක්ම ඊහේ උත්සාහ ගරන බව පොන්නම්බලම් මහතා කීවා. ඔහු පැවසුවේ මඳ වශයෙන් ලැබෙන වැස්ස පවා නොලැබෙන කාලවලටත්, ගොවිපල හිස්ව තියෙන්නට නොහැර මුං ඇට, කුරක්කන් ආදී ධාන්‍ය වර්ග එහි වවන බවයි. යාපනය අර්ධද්වීපයේ එක් අක්කරයක මයියොක්කා වගාවෙන් රු. 20,000/- ක් පමණ ලබා ගත හැකි බවද සඳහන් විනි.

## නොකඩවා නිෂ්පාදනය පවත්වා ගැනීමට පසෙහි සාරවත් බව රැක ගැනීම

යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී වී.සත්තියනාදන් මහතා විසින් මෙම විෂයය යටතේ සාකච්ඡාව මෙහෙයවනු ලැබුවා. යාපනය දිස්ත්‍රික්කයේ ඉතාමත් උද්යෝගිමත් තරුණ ගොවියෙක් හැටියට කවුරුත් විසිනුත් සළකනු ලැබෙන එන්.ජයරත්නම් මහතා මෙම විෂයය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ තත්වය ගැන ඉතාමත් පැහැදිලි අවබෝධයක් අනිකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණි සිටි බොහෝ ගොවි මහතුන් හට මෙන්ම සහභාගී වූ නිලධාරී මහතුන් හටත් ලබා දුන්නා. හමනට හුරු පුරුදු දෙමළ බස මෙන්ම සිංහල භාෂාවද හොඳින් කථා කිරීමට දත් ජයරත්නම් මහතා සෑහෙන අධ්‍යාපනයක් ලබා ඉන් පසුව නොයෙකුත් රැකියා බලාපොරොත්තුවෙන් සිට ඒවා නොලැබුණු හෙයින් තම ඕනෑකමින්ම ගොවිතැන් කටයුතු ආරම්භ කර එනයින් ඉතාමත්ම උසස් තත්වයක් ළඟා කර ගත් අයෙක්. ඔහු හඳුන්වා දෙමින් දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී සත්තියනාදන් මහතා පැවසුවේ යාපනය දිස්ත්‍රික්කයේ සාමාන්‍යයෙන් පුරුද්දක්ව පවතින්නේ උසස් රජයේ නිලධාරීන්ට පමණක් ලොකු දෑවැද්දක් ඇතිව තම දියනියන් සරණ පාවා දීම වුවත් ජයරත්නම් මහතා ගොවියෙක් හැටියට වැඩ කළත් ඔහුට ලොකු දෑවැද්දක් ඇතිව විවාහ කර ගැනීමට හැකි වූයේ ගොවිතැන් කටයුතු වලින් ඔහු ලබා ගත් ඉතාමත් විශාල දියුණුව නිසා බවයි.

යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් අනිකුත් දිස්ත්‍රික්කවල ගොවි මහතුන්ට වඩා වැඩි ආදායමක් ලබන ගොවීන් හැටියට පිළිගෙන ඇතත් ඔවුන් හට සිය කටයුතු කරගෙන යාමේදී නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට සිදුව ඇති ආකාරය ජයරත්නම් මහතා විසින් පෙන්වා දෙන ලදී.

පසෙහි සාරවත් බව ආරක්ෂා කර ගැනීම සඳහා තම ගොවිපලේ උපයෝගී කර ගන්නා නොයෙකුත් ක්‍රම උපක්‍රම පිළිබඳව ඉතාමත් වැදගත් කරුණු ජයරත්නම් මහතා විසින් අනිකුත් දිස්ත්‍රික්කවල සිට පැමිණි ආගන්තුක ගොවි මහතුන් හට ඉතාමත් ඕනෑකමින් හඳුන්වා දෙනු ලැබුවා. පාසැලෙන් අස් වූවාට පසුව පූර්ණවෙන් ගොවිතැන් කටයුතු ආරම්භ කර

කෙටි කාලයක් ඇතුළත යාපනය දිස්ත්‍රික්කයේ පොහොසත් ගොවියෙකු බවට පත් වීමට තමන් විඳි දුක් ගැහැට ගැන ඔහු ඉතාමත් අවංකව කථා කළා.

පසෙහි සරු බව රැක ගැනීම සඳහා තම ගොවිතැන් කටයුතුවලදී කොම්පෝස්ට් පොහොර භාවිතයට සෑම අවස්ථාවකම උනන්දු වන බව ජයරත්නම් මහතා ප්‍රකාශ කළා. ජයරත්නම් මහතාගේ අදහස අනුව කිසියම් බෝගයකින් ක්ෂණිකව වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා රසායනික පොහොර ප්‍රයෝජනවත් වුනත් ගොවිපලේ භූමියෙහි සරු බව දීර්ඝ කාලයක් පවත්වා ගැනීම සඳහා කොල පොහොර සහ ගොම පොහොර ඉතාමත් සතුටුදායක පොහොර වර්ගයක්. ඔහු පැවසුවේ ඔහුගේ ගොවිපලේ යොදා ගැනීම සඳහා වවුනියාව, කැකිරාව, අනුරාධපුරය ආදී ඈත ප්‍රදේශ වලින් එක ලොරියකට රු. 650/- ක් බැගින් ගෙඩා ගොම පොහොර සිය ගොවිපලට රැගෙන එන බවයි. ලාච්චම් හතරකට එහෙම නැත්නම් ආසන්න වශයෙන් අක්කර 1/4 කට පමණ ගොම පොහොර දමනවා නම් ටොන් 10 ක් පමණ අවශ්‍ය බව ජයරත්නම් මහතා පැවසුවා. කෙසේ වෙතත් යාපනය දිස්ත්‍රික්කයේ හුඟක් ගොවි මහතුන් පාවිච්චි කරන්නේ මෙම ප්‍රමාණයෙන් භාගයක් පමණ බව ඔහු පිළි ගත්තා. පළමුවෙන්ම තම ගොවිපල පුරාම වැසී යන පරිදි තල් ගස්වල කොල අතුරන බව ජයරත්නම් මහතා ප්‍රකාශ කළා. අක්කර 1/4 කට මේ විදිහට තල් කොල ඇතිරීම සඳහා රු. 225/- ක් පමණ වියදම් වන බව ඔහුගේ අදහසයි. මේ විදිහට තල් කොල අතුරා දින කිහිපයක් තැබීමෙන් පසෙහි සරු බව වැඩි කර ගැනීමට පමණක් නොව වල් පැල මර්ධනය කිරීමටත් එය ලොකු උපකාරයක් වන බව ඔහු කීවා. ඔවුන් තල් කොල පාවිච්චි කරන්නේ පොහොර වශයෙන් පමණක් නොව වල් පැල මර්ධනයක්ද හැටියටයි. අමු ගොම ගොවිපලට දමන්නේ නම් ඒවායේ ඇති වල් පැළෑටි ඇට පැල වී ගොවිපල පුරා වල් පැල ඇති විය හැකි නිසා ගොම වලින් ගොවිපල ඇතුරූ විට පවා ඒ මතු පිටින් තල් කොල දමා වසා තැබීමෙන් එම වල් පැල මර්ධනය කර ගත හැකි බව ජයරත්නම් මහතා පැවසුවා. ඔහු කියා සිටියේ අඩුම වශයෙන් මාස දෙකක් පමණ කාලයකදී විතරයි ගොවිපලේ කිසියම් බෝගයක් වගා නොකර හිස්ව තියෙන්නේ. වරින් වර මාරුවෙන් මාරුවට එළවළු, මිරිස්, අර්තාපල්, සෝයා බෝංචි ආදී බෝග වර්ග ගණනාවක් ගොවිපලේ වගා කරන නිසා මේ අයුරින් නොනවත්වා නිෂ්පාදනය පවත්වා ගැනීමට පසෙහි සාරවත් බවක් තිබිය යුතු බව ඔහු ප්‍රකාශ කළා. ඒ නිසා ගොවිපලේ පස සරු කර ගැනීමට දේශීය වශයෙන් යොදා ගත හැකි සෑම උපක්‍රමයක්ම උපයෝගී කර ගැනීම තමන්ගේ පරමාර්ථය බව ජයරත්නම් මහතා අවසාන වශයෙන් කියා සිටියා.

ජයරත්නම් මහතා විසින් මෙනයින් කරුණු පැහැදිලි කර දීමෙන් පසුව ගොවි මහතුන් අතර මහත් උනන්දුවක් දක්නට ලැබුනා. අනිකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් මේ අයුරින් දේශීය වශයෙන් ලබා ගත හැකි පොහොර වර්ග භාවිතා කිරීම පිළිබඳව දිගින් දිගටම ජයරත්නම් මහතාගෙන් නොයෙකුත් ප්‍රශ්න විමසන්නට පටන් ගත්තා.

විශේෂයෙන් අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන්ට දැන ගැනීමට ඕකූෑ කළා ජයරත්නම් මහතා ගොවිපලේ අනුගමනය කරන නොයෙකුත් ක්‍රම උපක්‍රම පිළිබඳව තව තවත් විස්තර. ඒ සෑම ප්‍රශ්නයකටම ඉතාමත් ඕනෑකමින් මෙන්ම අත්දැකීමෙන් ලද පුළුල් දැනුමක් ඇතිව පිළිතුරු දුන් ජයරත්නම් මහතා මැනවින් ඔප්පු කළේ තමන් කරන කාර්යය පිළිබඳව හොඳ අවබෝධයක් ඇතිව කටයුතු කරන ගොවි මහතෙකුගේ ස්වරූපයයි.

## කෘෂිකාර්මික නිෂ්පාදිත අලෙවිය

යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් නිපදවනු ලැබෙන නොයෙකුත් කෘෂිකාර්මික ද්‍රව්‍ය අලෙවි කර ගැනීම සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න පවතින බව දැන ගන්නට ලැබුනා. වික කලකට ඉහතදී සමූපකාර සංවිධානය ඉතාමත් සාර්ථක අයුරින් යාපනය ප්‍රදේශයේ ගොවි ජනතාවට සේවාවන් සැලසුවත් වර්තමානයේ නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් නොයෙකුත් කරදරවලට මුහුණ දීමට ගොවීන්ට සිදු වී ඇති බව පැහැදිලි වුනා. මෙම විෂයය යටතේ වූ සාකච්ඡාව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ආනන්ද වනසිංහ මහතා විසින් මෙහෙයවනු ලැබුවා. යාපනය දිස්ත්‍රික්කයේ ලාච්චම් 40 ක් හිමි එස්.අන්තෝනි පිල්ලේ මහතා තම ගොවිපලේ වගා කරන අල, ළූනු, මිරිස් ආදී ද්‍රව්‍ය අලෙවි කර ගන්නා ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දුන්නා. පාරිභෝගිකයාට අධික මිළක් ගෙවන්නට සිදු වන බෝග වර්ග වගා කලත් පාරිභෝගිකයා විසින් ගෙවනු ලැබෙන මුදල කිසිසේත් කෙලින්ම නිෂ්පාදකයාට නොලැබෙන බව ඔහුගේ අදහස වුනා. ඔහු කීවේ යාපනය දිස්ත්‍රික්කයේ නිපදවනු ලැබෙන කෘෂි ද්‍රව්‍යවල මිළ ඉහළ පහල යාම සිදු වන්නේ කොළඹ වෙළඳ පොලේ පවතින මිළ ගණන් අනුව බවයි. තමන්ගේ ගොවිපලේ නිපදවන තක්කාලි සාධාරණ මිළකට විකුණන්නට සමූපකාරයක් හෝ වෙනත් අලෙවි සංවිධානයක් නොමැති හෙයින් පෞද්ගලික ලොරි හිමියන් මගින් ඒවා පිටකොටුවේ එළවළු වෙළඳ පොලට අලෙවිය සඳහා එවන බව අන්තෝනි පිල්ලේ මහතා පැහැදිලි කළා. තක්කාලි වැනි ද්‍රව්‍යයක් විශේෂයෙන් දිනකදී හෝ දෙකකදී විකිණිය යුතු, ඉක්මනින් විනාශ වන සුළු ද්‍රව්‍යයක් නිසා අස්වැන්න නෙලා ගත්ත සැනින් කවර හෝ මුදලකට එය විකිණීමට ගොවි මහතුන්ට සිදු වන බව අන්තෝනි පිල්ලේ මහතාගේ අදහස වුනා.

මෙම අයහපත් තත්වය මග හරවා ගැනීමට මාර්ගයක් නොමැතිද යනුවෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ඔහු පැවසුවේ පෞද්ගලික වෙළෙඳුන් ගණනාවක් එළවළු හා බෝග යනාදිය මිළදී ගැනීමට පැමිණෙන නිසා නිෂ්පාදකයින් අතර තරඟයක් පවතින හෙයින් ගොවි මහතුන් විසින්ම ඔවුන්ගේ සංවිධානයක් ඇති කර ගතහොත් මෙම තත්වය වඩාත් යහපත් කරගත හැකි බවයි. මෙවැනි නිෂ්පාදක සංවිධානයක් ඇති කර ගැනීමෙන් පෞද්ගලික වෙළෙඳුන්ගේ සූරාකෑම නතර කර ගත හැකි බව අන්තෝනි

පිල්ලේ මහතාගේ අදහස වුනා. ඔහු පැවසුවේ එවැනි සංවිධානයකට ඇත්ත වශයෙන්ම රජයේ නිලධාරීන්ගේ උදව්ව උවමනා කරන බවයි. නිදසුනක් වශයෙන් රතු ළූනු සම්බන්ධයෙන් මේ ආකාරයෙන් ගොවීන් සංවිධානය වී ඒවා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට විකුණූ අවස්ථාවෙහි නිෂ්පාදකයින්ට හොඳ මුදලක් ලැබුණු බව අන්තෝනි පිල්ලේ මහතා ප්‍රකාශ කළා. ඔහු එවැනි සංවිධානයක දුර්වලතාවයක් හැටියට පෙන්වා සිටියේ කලට වේලාවට මුදල් නොලැබීමයි. කෙසේ වෙතත් මේ කාලයේදී නම් පෞද්ගලික වෙළඳුන්ගෙන් වුවද තමන්ගේ නිෂ්පාදනවලට සෑහෙන සාධාරණ මිලක් ලැබෙන බව අන්තෝනි පිල්ලේ මහතා කීවා.

අඩු අස්වැන්නක් ලැබෙන සෑම විටම කෘෂි ද්‍රව්‍යයන්හී මිළ ගණන් අධික වන බවත් අස්වැන්නකින් පසුව මිරිස් වැනි ද්‍රව්‍යයක් වුවත් ගබඩා කර තබා ගැනීමට සුළු ගොවියාට හැකියාවක් නොමැති හෙයින් ඒ දිනවලදී ලැබෙන මිළ ගණන්වලට කෘෂි ද්‍රව්‍ය අලෙවි කිරීමට ඔවුන්ට සිදු වන බවත් ඔහු කියා සිටියා. ඒ වුනත් පොහොසත් ගොවීන් හා අතරමැදියන් අස්වැන්න වැඩි කාලෙකට ඒවා ලබාගෙන ගබඩා කර තබා මිළ අධික කාලවලදී විකිණීමෙන් හොඳට ලාභ-ලබා ගන්නා බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළා. මෙවැනි තත්වයකින් කටයුතු කිරීමට සුළු ගොවියාටත් හැකි වන ක්‍රියා මාර්ගයක් සැලසෙන්නේ නම් එය සුළු ගොවීන්ට කරන ලොකුම යහපතක් බව ඔහුගේ අදහසයි. නිදසුනක් වශයෙන් මේ කන්නයේ දැන් අර්තාපල් අස්වැන්න රැස් කිරීම පිළිබඳ තත්වය අන්තෝනි පිල්ලේ මහතා පැහැදිලි කළා. බීජ අල ලැබීමට ප්‍රමාද වූ නිසා සියළුම ගොවීන් එක වරම පැලේ අල වගා කළ හෙයින් දැන් අස්වැන්නද එක් වරම ලැබීමෙන් වැඩි අල ප්‍රමාණයක් වෙළඳ පොලට ලැබෙන බව ඔහු කීවා. මෙයින් සිදු වන්නේ මිළ ගණන් පහත ගොස් ගොවීන් හට සුළු ආදායමක් ලැබීමයි.

## සමූපකාරය හා ණය

කුඩා බිම් කට්ටියක වුවත් ඉතාමත් සූක්ෂම අයුරින් ගොවිතැන් කරගෙන යන ගොවි මහතුන් හට විශේෂයෙන් ණය පහසුකම් අතිශයින්ම අවශ්‍ය බව යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන්ගේ අදහසයි. මෙම අදහස සමුළුවට පැමිණි සිටි අනිකුත් දිස්ත්‍රික්කවල ගොවි මහතුන් විසින්ද අනුමත කරනු ලැබුවා. තින්නවේලිහි විශ්‍රාම ලත් ගුරුවරයෙකු වූ පී. කුමාරස්වාමි මහතා එක්දහස් නවසිය තිස් ගණන්වල සිටම සමූපකාරය හා සම්බන්ධව කටයුතු කළ කෙනෙක්. ඒ නිසා යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් හට ණය, පොහොර ආදී පහසුකම් සපයා දීමේදී සමූපකාරය කවර ආකාරයකින් කටයුතු කළයුතුද යන බවට කරුණු ඉදිරිපත් කිරීමට ඔහුගේ දීර්ඝ අත්දැකීම තුළින් ඔහුට පිළිවන්කම ලැබෙනවා. සමූපකාර කටයුතුවලට ආධාර කළා පමණක් නොව කුමාරස්වාමි මහතා දීර්ඝ කාලයක් තිස්සේ පුළුල් අයුරින් ගොවිතැන් කටයුතු කළ කෙනෙක්. ඔහු ඒ

අනුව සමුපකාරය කවර ආකාරයකින් ගොවීන්ගේ යහපත සඳහා කටයුතු කළයුතුද ගොවීන්ට දිය යුතු ණය කවර තත්වයක විය යුතුද යන කරුණු පිළිබඳව යාපනයේ සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් එස්. නාගලිංගම් මහතාගේ මෙහෙයවීම යටතේ කරුණු පැහැදිලි කළා.

ඔහු පළමුවෙන්ම කියා සිටියේ ගොවීන් වෙත රජයෙන් නියම කර ඇති ණය සීමා ප්‍රමාණවත් නොවන බවයි. අර්තාපල් වගාව සම්බන්ධයෙන් කථා කරමින් කුමාරස්වාමි මහතා කියා සිටියේ කලින් අක්කරයකට දුන් ණය මුදල වන රු. 3,000/- දැන් රු. 5,000/- තෙක් වැඩි කර ඇතත් එම ප්‍රමාණය වුවද ක්‍රමානුකූල වගාවක් සඳහා නොසෑහෙන බවයි. අක්කරයකින් 1/8 ක් සඳහා බීජ අල හොණ්ඩර දෙකක් අවශ්‍ය බවත්, දැන් එක් බීජ අල හොණ්ඩරයක් රු. 425/- ක් වන බවත් ඔහු කියා සිටියා. කෙසේ වෙතත් කුමාරස්වාමි මහතා පැවසූ අන්දමට බීජ අල ලබා ගැනීම සඳහා ණය ලැබෙන්නේ රු. 625/- ක් පමණයි. දීර්ඝ කාලයක් තිස්සේ ලත් අත්දැකීම් අනුව කථා කළ කුමාරස්වාමි මහතා අවධාරනයෙන්ම පැවසුවේ අර්තාපල් වගාව සඳහා රජයෙන් දෙන ණය මුදලින් කළහැකි වන්නේ, බීජ අල සහ පොහොර පමණක් මිළදී ගැනීම පමණක් බවයි. ඔහු පැවසූ අන්දමට කෘමි නාශක ද්‍රව්‍ය සඳහා යන වියදම්, වල් පැල මර්ධනය, අස්වැන්න රැස් කිරීම ආදිය සඳහා වැය වන මුදල් රජයෙන් දෙන ණය මුදලෙන් පිරිමසා ගැනීමට කිසිසේත් හැකියාවක් නැහැ. රතු ළූනු වගාව සම්බන්ධයෙන් දැනට තිබෙන ණය ප්‍රමාණයද වැඩි කළයුතු බව ඔහුගේ අදහස වුනා.

ගොවීන් හට නොයෙකුත් ආයතන මගින් ලබා ගැනීමට පිළිවන් ණය මුදල් ප්‍රමාණවත් නොවන නිසා ඔවුන්ගෙන් වැඩි දෙනෙක් තමන් සතු රන් රිදී ආභරණ උගස් කර ණය මුදල් ලබාගෙන ඒවා වගා කටයුතුවලට ආයෝජනය කරන බවත් යම්කිසි හේයකින් වගා පාඩුවක් සිදු වුවහොත් වැඩි කාලයක් සඳහා එම උගස් බඩු වෙනුවෙන් පොලී වශයෙන් අධික මුදලක් වැය කිරීමට ඔවුනට සිදු වන බවත් කුමාරස්වාමි මහතා පැහැදිලි කළා.

යාපනය දිස්ත්‍රික්කයේ වගා කටයුතු ආරම්භ කිරීමේදී නොයෙක් පෙදෙස්වල පොළව මතුපිට ඇති වැලි ගල් තට්ටුව අඩි දෙකක් තුනක් පමණ යටට කැඩීමට සිදු වන හෙයින් මේ කාරණය සඳහා අධික මුදලක් වැය කිරීමට සිදු වනවා. මෙසේ ගොවිපල පිළියෙල කර ගැනීම සඳහා යම්කිසි ආධාර මුදලක් සැපයීමට කටයුතු සළස්වන්නේ නම් එය ගොවීන්ගේ සුභ සිද්ධියට හේතු වන බව කුමාරස්වාමි මහතා ඉතාමත් ඕනෑකමින් කියා සිටියා.

සමුපකාර ක්‍රමය තුළ සුළු සුළු අඩු පාඩුකම් තිබුණත් ඇත්ත වශයෙන්ම ගොවීන්ගේ යහපත සඳහා එය තව තවත් වැඩි දියුණු කළයුතු සංවිධානයක් බව .

කුමාරස්වාමි මහතා කියා සිටියා. නිදර්ශනයක් වශයෙන් එක කන්නයක මිරිස් හොණ්ඩර 340 ක් සමුපකාරය විසින් මිළයට ගෙන ඒවා ගබඩා කර තබා වෙළඳ පොලෙහි අධික මිළ ගණන් පවතින අවස්ථාවක නැවත විකිණීමෙන් ලැබුණු ලාභය ගොවීන් අතර බෙදා දීමට වරක් සමුපකාරය කටයුතු කළ අන්දම ගැන ඔහු ප්‍රශංසා මුඛයෙන් කථා කළා. කෙසේ වුවත් මෙවැනි සංවිධානයක් සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ගේ සහාය ඉතාමත් අවශ්‍ය බව ඔහුගේ අදහස වුනා. මිරිස් ප්‍රවාහනය සම්බන්ධයෙන් පැනවූ බාධක ඉවත් කිරීම හේතුකොටගෙන මිරිස්වලටත් දැන් හොඳ මිළ ගණනක් ලැබෙන බවත්, රතු ළූනු සඳහාද සෑහෙන සාධාරණ මිළ ගණනක් ගොවීන් හට ලැබෙන බවත් කුමාරස්වාමි මහතා කියා හිටියා. කෙසේ වෙතත් දැන් සිදු වන පරිදි කොළඹ වෙළඳ පොලේ මිළ ගණන් අධික වන විට නියම කාලයට පෙර අර්තාපල් යනාදියෙහි අස්වැන්න රැස් කර ගැනීමට ගොවි මහතුන් අදහස් කරන්නේ හොඳ අලෙවි සංවිධාන ක්‍රමයක් නොමැති නිසා බව ඔහු පැවසුවා. මෙවැනි ක්‍රියාවන් මැඩ පැවැත්වීමට මනාව සංවිධානය වූ සමුපකාරය වැනි ආයතනික ක්‍රමයකින් හැකි වන බව කුමාරස්වාමි මහතාගේ අදහස වුනා.

අවසාන වශයෙන් සිය අත්දැකීම් තුළින් ලත් දැනුම අනුව කුමාරස්වාමි මහතා ප්‍රකාශ කළේ පෞද්ගලික ක්‍රමයට මෙන් නොව සමුපකාර ක්‍රමයට ගොවිතැන් කිරීමෙන් පෞද්ගලිකව ගොවීන් හටත්, පොදුවේ රටටත් ඉමහත් සේවයක් වන බවයි. සාමාන්‍යයෙන් පොදු දුෂ්කරතා තිබෙන්නට පිළිවන් වුවද සමුපකාර සංවිධාන ක්‍රමය කාර්යක්ෂම කිරීමෙන් උසස් සේවයක් ගොවි මහතුන්ට ලබා ගැනීමට පිළිවන් වන බව ඔහු අදහස් කළා.

## සාකච්ඡා වාරය

සාකච්ඡා වාරයේදී ඒ ඒ දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් හට යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් සමඟ සිය අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාවක් සළසා දෙන ලදී. මෙහිදී යාපනය දිස්ත්‍රික්කයෙහි කුඩා බිම් කැබලිවල කරගෙන යනු ලබන සූක්ෂම ගොවිතැන් ක්‍රම පිළිබඳවත් ඇල දොල හෝ ගඟා නොමැති තත්වයක් යටතේ පොලව යට ඇති ජලය ලබා ගන්නා ක්‍රම පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අනිකුත් දිස්ත්‍රික්කවල ගොවි මහතුන් උද්යෝගිමත් වූහ. එසේම ඒ ඒ දිස්ත්‍රික්කවල ගොවිතැන් කටයුතු කරගෙන යාමේදී මුහුණ පාන්නට සිදු වන නොයෙකුත් කම්කටොළු හා හිරිහැර පිළිබඳවද ඔව්හු විස්තර කළහ.

කොළඹ දිස්ත්‍රික්කයෙන් පැමිණි ගොවි මහතුන් විසින් තම දිස්ත්‍රික්කයේ පවතින තත්වය පිළිබඳව මනා විස්තරයක් ඉදිරිපත් කරන ලදී. රසායනික පොහොර බෙහෙවින් මිළ අධික තත්වයකට පත්ව ඇති නිසා කොම්පෝස්ට් පොහොර භාවිතා කිරීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් අතර දැන් ලොකු උනන්දුවක් පවතින බව මෙහිදී පැවසිනි.

ගොවිතැන් කිරීමට අවශ්‍ය තරම් ඉඩ කඩම් නොමැති නිසා ඉඩම් හිඟය පිළිබඳ ප්‍රශ්නය විසඳිය යුතු බවත් අතිරේක ආහාර බෝග තවත් වැඩි අක්කර ප්‍රමාණයක් තුළ වගා කළයුතු බවත් ගොවිතැන් කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ ප්‍රමාදයකින් තොරව සාධාරණ මිළ ගණන්වලට ගොවීන් හට ලබා දිය යුතු බවත් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් ගෙන හැර පෑ කරුණු අතර විය.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පැමිණි 68 වියැති අනඳහාමි ගොවි මහතා විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින ගොවිතැන් කටයුතු පිළිබඳ ප්‍රශ්න ගැන කරුණු ඉතාමත් ප්‍රවීණ අයුරින් විස්තර කරන ලදී. යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් වෙත සහෝදරත්වය, හොඳ හිත පැතිරවීමට නිරතුරුවම සූදානමින් සිටින බව පැවසූ ඔහු යාපනයේ ගොවිපලවල දක්නට ලැබෙන සරු සාර බව කෙරෙහි සිය සතුට නොවලහා පළ කළේය. අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජලය ලබා ගැනීමේ කටයුතු තව තවත් පුළුල් කළයුතු බව එම දිස්ත්‍රික්කයේ ගොවි මහතුන්ගේ අදහස විය. ඔවුන් බොහෝ දෙනෙක් පැවසුවේ ගොම පොහොර, දහයියා ආදිය වඩාත් පුළුල් අයුරින් පොහොර වශයෙන් යොදා ගැනීමෙන් භූමියෙහි සරු සාර බව දිගටම පවත්වා ගත හැකි බවයි. අනුරාධපුර හේන් ගොවිතැන් කරන ගොවි මහතුන් බොහෝ දෙනෙකුගේ අස්වනු රැස් කිරීම බොහෝ අවස්ථාවලදී එක් වරම වාගේ සිදු වන හෙයින් එවැනි තත්වයකදී ඉතාමත් අඩු මිළ ගණන්වලට එළවළු යනාදිය විකිණීමට ගොවීන්ට සිදු වන බව ඔව්හු පැහිදිලි කළහ. එහෙයින් හේන් ගොවි මහතුන්ගේ එළවළු හා බෝග යනාදිය අලෙවි කර ගැනීමට මාර්ග ලබා දීම ඉතාමත් අවශ්‍ය බව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි මහතුන්ගේ මතය විනි. රජයේ ආයතන වලින් ණය ලබා ගැනීමට සිදු වන ප්‍රමාදය නිසා පෞද්ගලිකව හිත මිත්‍රාදීන්ගෙන් හා පොලියට ණය දෙන්නන්ගෙන් මුදල් ලබා ගැනීමට සිදු වීමෙන් ගොවි මහතුන් නොයෙකුත් කරදර හිරිහැරවලට මුහුණ දෙන බව පැවසූ ඔව්හු ප්‍රමාදයක් නොමැතිව කලට වේලාවට වගාවට ප්‍රමාණවත් පරිදි ණය ප්‍රමාණයක් ලබා දීම ඉක්මණින් සළකා බැලිය යුතු කාරණයක් බව පැවසූහ.

මන්නාරම් දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින්ද ඔවුන්ගේ ගැටළු පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන ලදී. ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවය පිළිබඳව පැවසූ ඔව්හු දැනට පවතින ළිං තවත් ගැඹුරු කිරීමෙන් හෝ නල ළිං ලබා දීමෙන් ජල ප්‍රශ්නය මග හරවා ගැනීමට ඉක්මණින් කටයුතු කළයුතු බව පැවසූහ. ගොවි මහතුන්ගේ නිෂ්පාදන සාධාරණ මිළකට ලබා ගන්නා සංවිධානාත්මක ආයතනික සේවාවන් ලබා දීමේ අවශ්‍යතාවය ඔව්හු දැක්වූහ.

වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින්ද කරුණු ඉදිරිපත් කරන ලද්දේ ප්‍රමාණවත් පරිදි ජලය ලබා දීමේ ප්‍රශ්නය පිළිබඳවය. එක් ගොවි මහතෙකු විසින්

මෙහිදී පැවසුවේ එක් එක් දිස්ත්‍රික්කයන් සම්බන්ධයෙන් පස් පරීක්‍ෂා කර එම පස් වලට අනුව කවර බෝග රටාවක් ඉදිරිපත් කළ යුතුදැයි ඔවුනට උපදෙස් දීම සඳහා දැනට වඩා කාර්යක්‍ෂම කිසියම් සංවිධාන ක්‍රමයක් තිබිය යුතු බවයි. පසෙහි සරු බව හෝ නිසරු බව ගැන අවබෝධයක් නොලබන ගොවි මහතුන් ඇතැම්විට අවශ්‍ය ප්‍රමාණයට අඩුවෙන් හෝ වැඩියෙන් පොහොර තම බෝගවලට යොදන බව ඔහු පැවසුවේය. තවදුරටත් කරුණු පැහැදිලි කරමින් ඔහු සඳහන් කළේ එවැනි සේවාවක් ලබා දෙන්නේ නම් එම කාර්යයට සරිලන ගාස්තුවක් ගෙවීමට පවා තමන් සූදානම් බවයි. වවුනියාව දිස්ත්‍රික්කයෙහි පවතින තවත් උග්‍ර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් විශේෂයෙන් කරුණු සඳහන් කළ එක් ගොවි මහතෙක් වන සතුන්ගෙන් වගාවන් ආරක්‍ෂා කර ගැනීම සඳහා ගොවි මහතුන් හට තුවක්කු හා පතොරොන් ලබා දීමට කඩිනමින් කටයුතු කරන මෙන් ඕනෑකමින් ඉල්ලා සිටියේය.

අනිකුත් දිස්ත්‍රික්කවලට පොදු තවත් ප්‍රශ්නයක් මෙම දිස්ත්‍රික්කයටද පොදු වශයෙන් යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් පැහැදිලි කර දෙන ලදී. එනම් තම නිෂ්පාදන කලට වේලාවට අලෙවි කර ගැනීමට ක්‍රමවත් කාර්යශීලී සංවිධාන ක්‍රමයක් නොමැතිකමයි. යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් වැඩි දෙනෙක් තරයේම ඉල්ලා සිටියේ වතුර පොම්ප ලබා ගැනීම සඳහා ගොවි මහතුන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් නොපමාව ඉටු කළයුතු බවයි. යාපනයේ ගොවි මහතුන් විසින් පාවිච්චි කරන වර්ගයේ උදළු තල නොමැතිකමද ගොවීන් හට මුහුණ දීමට සිදුව ඇති ගැටළුවක් ලෙස ඔව්හු සඳහන් කළහ. පොහොර මිළ අඩු කිරීම, ඉක්මණින් බීජ වර්ග ලබා දීම, අර්තාපල් යනාදිය සඳහා තව තවත් වැඩියෙන් ණය මුදල් සපයා දීම යාපනයේ ගොවි මහතුන් හට ඉක්මණින් අවශ්‍ය කරුණු බව ඔව්හු සඳහන් කළහ. මුළුමනින්ම මහ පොලවෙන් ලබා ගන්නා ජලය භාවිතයට ගෙන ගොවිතැන් කරන යාපනයේ ගොවි ජනතාවගේ ඉල්ලීම වූයේ තව තවත් වැඩියෙන් ගොවිතැන් කිරීම සඳහා කවර හෝ ආකාරයකින් ජලය ලබා ගැනීමට පහසුකම් සලසා දෙන ලෙසයි.

## සමුළුව ගැන අදහස්

අවසානයේදී ඒ ඒ දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් විසින් යාපනයෙහි සිදු වූ මේ හමුවීම පිළිබඳව ඔවුන්ගේ අදහස් දක්වනු ලැබිණි. අනුරාධපුරයෙන් පැමිණි අන්දහාමි මහතා යාපනය දිස්ත්‍රික්කයෙහි තමන් ලද අත්දැකීම පිළිබඳව අතිශයින් සතුටට පත්ව යාපනයේ ජනතාව ආගන්තුක සත්කාරය කෙරෙහි දක්වන ලද සැළකිල්ල පිළිබඳව විශේෂයෙන් කරුණු දක්වමින් දීර්ඝ කථාවක් කළේය. පිට රටින් මෙරටට විශාල විදේශ විනිමය යොදා ගෙන්වනු ලබන නොයෙක් බෝග වර්ග මෙරටෙහි නිෂ්පාදනය කිරීමට යාපනයේ ජනතාව දක්වන උනන්දුව ගැන ස්තුති කළ ඔහු එකම

වහලක් යටතේ ජාති, භාෂා, කුල භේද වලින් තොරව ගොවි මහතුන් හට මෙනයින් සුහදව අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසූ සෑම දෙනාටම ස්තූති කළේය. සිය ජීවිත කාලයේදී ඔහුට දැන ගන්නට ලැබුණු ඒ විදිහේ එකම සම්මන්ත්‍රණය යාපනයේ එම සමුළුව බව ඔහු සඳහන් කළේය.

අනිකුත් දිස්ත්‍රික්ක වලින් පැමිණි ගොවි මහතුන් විසින්ද සමුළුවෙහි දක්නට ලැබුණු සුහද සහෝදරත්වය අතිශයින් අගය කරන ලදී. මෙවැනි සම්මන්ත්‍රන තව තවත් නොයෙකුත් පළාත්වල පැවැත්වීමෙන් උතුරේ සිට දකුණටත්, නැගෙනහිර සිට බටහිරටත් සහෝදරත්වය පැතිරවීමට ගොවි මහතුන් හට අඩිතාලම යෙදිය හැකි බව ඔවුන් බොහෝ දෙනාගේ මතය විය.

යාපනයේ දිසාපති විමල් අමරසේකර මහතා සිංහලෙන් හා දෙමළෙන් කථා කරමින් ගොවිකටයුතු ඉතිහාසයේ පළමුවන වරට මෙවැනි සමුළුවක් යාපනයේ පැවැත්වීම ගැන සිය ස්තූතිය පුද කළේය. වෙනත් දිස්ත්‍රික්කයන්හි ගොවි මහතුන් යාපනයට කැඳවා සුහද සාකච්ඡාවලට ඉඩ සළසා අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාවක් සළසා දීම සඳහා කටයුතු සැලසූ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට ඔහුගේ කෘතඥතාවය පිරි නැමීය. ජාතියේ ජීව රුධිරය ලෙස සැළකිය හැකි ගොවි මහතුන් ජාති, භාෂා, භේද වලින් තොරව රටේ එකම ජාතියක් හැටියට ජීවත් වීමත්, ඔවුන්ගේ එකමුතු ප්‍රයත්නය තුළින් සංවර්ධිත දේශයක් ගොඩ නැංවීමත් අපගේ එකම අපේක්ෂාව විය යුතු බව විමල් අමරසේකර මහතාගේ අදහස විය. ජාති වශයෙන් ජනතාව වෙන් කරන නොයෙකුත් කපොළු ළඟදීම ඉවත් වන බව ඔහු අවධාරණයෙන්ම ප්‍රකාශ කළේය.

මන්නාරම දිසාපති එන්.ජෙයනාදන් මහතා කථා කරමින් මෙවැනි සමුළුවක් සංවිධානය කළ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට ස්තූති කර සමුළුව තුළින් මතු වූ කරුණු ඉතාමත් ඉක්මණින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී මහතා සිය අදහස් දක්වමින් රටෙහි පවතින නොයෙකුත් ප්‍රශ්නවලට විසඳුම සෙවිය හැක්කේ ගොවිජන සංවිධානයකට පමණක් බව සඳහන් කළේය. අපේ ආහාර මෙරටෙහිම නිපදවා මෙහිම මුදල් රැස් කිරීමෙන් දැනට පවතින උග්‍ර අර්බුද වලින් මිදීමට අපට කටයුතු කළහැකි බව ඔහු පැවසීය.

ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නීති අධ්‍යක්ෂ අයි.කේ.වීරවර්ධන මහතා කරුණු තුනක් අනුව මෙම සම්මන්ත්‍රණය ඉතා වැදගත් වන බව පළ කළේය. ජාතියක් වශයෙන් භේද නොතකා සහෝදරත්වය ගොඩ නැගීම, යාපනය දිස්ත්‍රික්කයේ ඉඩම් වලින් උපරිම පලය ලබා ගැනීමට ගොවි ජනතාව දරණ වෙහෙස හා යොදන ශ්‍රමය

පිළිබඳ අත්දැකීම අනිකුත් දිස්ත්‍රික්කවල ගොවි මහතුන් හට ලබා ගැනීමට හැකි වීම හා ජලය අතිශයින් හිඟව පවතින ප්‍රදේශවල එම ප්‍රශ්නය විසඳා ගැනීමට ගොවි මහතුන් ගෙන ඇති ක්‍රියා මාර්ගය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ආදී කරුණු මෙම ගොවි හමුවෙන් මතු වූ වැදගත් සාධක හැටියට වීරවර්ධන මහතා විසින් සළකනු ලැබිණි. යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් දක්වන විශිෂ්ට ප්‍රයත්නයටත්, මෙවැනි අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව සළසා දුන් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයටත් ඔහුගේ ස්තුතිය පිරි නැමිනි.

## සම්පිණ්ඩනය හා සමාප්තිය

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ සී. නාරායනසාමි මහතා සිංහලෙන් හා දෙමළෙන් කථා කරමින් සම්මන්ත්‍රණය තුළින් මතු වූ ඉතාමත් වැදගත් කරුණු කෙටි කර දැක්වීය. පහත සඳහන් පරිදි ඔහු විසින් සමුළුවෙහි සම්පිණ්ඩනයක් ඉදිරිපත් කරන ලදී:

1. යාපනයේ ගොවිතැන් ක්‍රම පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡා වලින් මතු වූ වැදගත් කාරණයක් වූයේ නල ළිංවල අවශ්‍යතාවයයි. යාපනය දිස්ත්‍රික්කයේ නල ළිං ක්‍රමය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කළ නොහැකි වුවත් මන්නාරම වැනි දිස්ත්‍රික්කයකට එය ඉතාමත් වැඩදායක බව මෙහිදී හෙළිදරව් වුනි. රජයෙන් ළිං කැනීම සඳහා දෙන ආධාර වැඩි කළයුතු බව ගොවි මහතුන් විසින් පවසන ලදී. මෙම ණය ප්‍රමාණය ඇත්ත වශයෙන්ම දැන් වැඩි කර ඇත. එමෙන්ම ගොවි ජනතාව වෙනුවෙන් ළිං කැනීමේ කාර්ය භාරය, පලදාව වර්ධන කමිටුවටත් භාර ගත හැකිය. වතුර පොම්ප සපයා දීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළයුතු වේ. වතුර පොම්ප අනිසි අයුරින් වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීමට වහාම කටයුතු කළයුතු අතර ඒවා ගොවිතැන් කටයුතු සඳහා පමණක් උපයෝගී කර ගන්නා බවට තහවුරු කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජලය මනාව ප්‍රයෝජනයට ගැනීම සඳහා යල කන්නයේදී කුඹුරුවල වෙනත් බෝග වැවීම වැඩ දායක වන බව මෙහිදී පැහැදිලි වුනේය. ළිං කැනීම සඳහා ඩයිනමයිට් මිළදී ගැනීමට දෙන සහනාධාර වැඩි කර ප්‍රාදේශීය නිලධාරී හෝ කෘෂිකර්ම උපදේශකගේ නිර්දේශය අනුව පලදාව වර්ධන කමිටුව මගින් ඩයිනමයිට් නිකුත් කළ යුතුය.

2. කොම්පෝස්ට් පොහොර වලවල් සෑදීමේ වැඩ සටහන තව තවත් පුළුල් කිරීම සඳහා රජයෙන් ආධාර දිය යුතු බව ගොවි මහතුන් විසින් ඉදිරිපත් කළ එක් කරුණකි. එසේම බෝග රටාව කාලයට හා වර්ෂාපතනයට ගැළපෙන පරිදි තෝරා ගැනීම අවශ්‍ය වන්නේය. ජලයෙන් උපරිම ලෙස ප්‍රයෝජනය ගැනීම සෑම ගොවි මහතෙකුගේම ආදර්ශ පාඨය විය යුතු අතර දේශීය පොහොර භාවිතා කිරීමේ වැදගත්කමද මෙම සම්මන්ත්‍රණයේදී ගොවි මහතුන් විසින් හුවා දක්වන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිතැන් කිරීම සඳහා ඉඩම් හිඟයක් පවතින බව එම දිස්ත්‍රික්කයෙන් පැමිණි ගොවි මහතුන් කියා සිටියහ. සාමූහික පදනමක් මත මෙන්ම පෞද්ගලික පදනමක් මත ගොවිතැන් කිරීම සඳහා ඉක්මණින් ඉඩම් සපයා දිය යුතු බව ඔවුන්ගේ අදහස විය.

3. එක් එක් ඉඩම්වල පස් වර්ග පරීක්ෂා කර ඒ පස්වලට සරිලන පරිදි බෝග වර්ග නිර්දේශ කිරීම පිළිබඳ වැඩපිළිවෙලක් කඩිනම් කිරීමෙන් ගොවි මහතුන් හට වැදගත් සේවාවක් වන බව පැහැදිලි වුණි. එසේම රසායනික පොහොර සාධාරණ මිළකට ලබා දීමේ අවශ්‍යතාවයද ගොවි මහතුන් විසින් සඳහන් කරන ලදී. රසායනික පොහොර හැකි පමණ අඩු කර වැඩි වැඩියෙන් දේශීය පොහොර භාවිතා කිරීමෙන් දිගු කලක් ඉඩමෙහි සරු සාර බව රැක ගැනීමට පුළුවන වන බවද ඇතැම් ගොවි මහතුන් විසින් පිළි ගනු ලැබිණි.

4. ගොවි මහතුන් විසින් නිපදවනු ලබන බෝග වර්ග යනාදිය අලෙවි කිරීමේදී නොයෙකුත් හිරිහැරවලට ඔවුනට මුහුණ දීමට සිදු වන බව ප්‍රකාශ වුනි. තමන්ගේ බෝග විකිණීමෙන් ඇත්ත වශයෙන්ම ගොවි මහතුන්ට සාධාරණ මිළක් නොලැබුණු බව ඔවුන් වැඩි දෙනෙක් විසින් පිළි ගන්නා ලදී. එනිසා අතිශයින් සංවිධානාත්මක ක්‍රමවත් අලෙවි රටාවක් අවශ්‍ය වන්නේය. අලෙවිය පිළිබඳ දැනට පවතින අසතුටුදායක තත්වය නිසා ගොවි මහතුන් හට සාධාරණ මිළක් නොලැබෙනවා පමණක් නොව පාරිභෝගිකයා හටද සිය අවශ්‍යතාවයන් සඳහා වැඩි මුදලක් වැය කිරීමට සිදු වන්නේය. මෙම තත්වය මග හරවා ගැනීමට නොයෙකුත් ආයතන විසින් කටයුතු ආරම්භ කළයුතු බව සමුළුවේදී හෙළිදරව් වුනේය. සෝයා බෝංචි, කහ, ඉඟුරු ආදිය අලෙවි කර ගැනීමට පහසුකම් නොමැති බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් විසින් පවසන ලදී. මේ සඳහා ඉක්මණින් විසඳුමක් අවශ්‍ය බව පිළි ගනු ලැබිනි. එම බෝග වර්ග මිළදී ගැනීමට යාපනය දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් මනාපය පළ කළ අතර එවැනි බෝග වර්ග හුවමාරු කර ගැනීමෙන් තව තවත්

සම්බන්ධතාවය ඇති කර ගත හැකි බව සමුළුවේදී ප්‍රකාශ විය. මෙය ගොවි සමුළුව නිසා ඇති වූ එක් ප්‍රයෝජනවත් ප්‍රතිපලයකි.

5. ගොවිතැන් කටයුතුවලට පිරිනමනු ලබන ණය ගැනද දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. දැනට වඩා ඉක්මණින් කලට වේලාවට ණය පහසුකම් ලබා ගැනීමේ මාර්ග සකස් කර දිය යුතු බව ගොවි මහතුන්ගේ අදහස විය.

6. කෘෂිකාර්මික සංවර්ධනයෙහි ලා අවශ්‍ය වන නොයෙකුත් කාර්යයන් උදෙසා විදුලි බලය සැපයීම ඉක්මණින් කළ යුතු බව/පැහැදිලි වුනේය.

7. පොහොර භාවිතය, බෝග තෝරා ගැනීම ආදිය පිළිබඳ විස්තර එක් එක් කෘෂි දේශගුණික ප්‍රදේශයකට ගැලපෙන අයුරින් හඳුන්වා දීම සඳහා ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය.

8. කොල පොහොර සහ ගොම පොහොර සෑදීම හා භාවිතය, වගාවන් සඳහා පස පිළියෙල කිරීම ආදී කරුණු සම්බන්ධයෙන් වඩාත් පුළුල් ව්‍යාප්ති සේවාවක අවශ්‍යතාවයද මෙම ගොවි හමුවෙන් හෙළිදරව් විණි.

1522
1975-7-30